පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය

වෙළුම 8 අංක 1 | 2006 ජනවාරි-පෙබරවාරි

# කෘෂිකර්ම දෙපාර්තමේන්තු නව ප්‍රභේද නිර්දේශය

කෘෂිකර්ම දෙපාර්තමේන්තු අධ්‍යක්‍ෂ ජනරාල් ආචාර්ය සී. කුඩාගමගේ මහතාගේ ප්‍රධානත්‍වයෙන් 2005.12.30 දින පැවැති ජාතික ප්‍රභේද නිර්දේශ කිරීමේ කමිටු රැස්වීමේදී නව භෝග ප්‍රභේද 20 ක් වගා කිරීම සඳහා නිර්දේශ කළ අතර, ප්‍රථම වරට $F_1$ දෙමුහුම් ප්‍රභේද කිහිපයක් ගොවි ජනතාව අතට පත් කිරීමට ද පියවර ගන්නා ලදී. BG 407 H වී ප්‍රභේදය, අමන්ද සහ අන්ජලී නමින් බටු ප්‍රභේද 02 ක් හා මහේෂා තක්කාලි ප්‍රභේදය මෙයට අයත් වේ.

දෙමුහුම් ප්‍රභේදයක් යනු ජානමය සම්බන්ධතාව අතින් දුරස් නුමුහුම් ප්‍රභේද 02 ක් මව් හා පිය පරම්පරාව ලෙස යොදා පරපරාගනයෙන් පළමු පරම්පරාවක් ($F_1$) නිපදවා එම බීජ වාණිජ ලෙස වගා කිරීමයි.

මෙහිදී මව් හා පිය පරම්පරාවල පවතින හිතකර ගුණාංග දෙමුහුම් දිරිය (Hybrid vigor or Heterosis) යන සංසිද්ධිය තුළින් වඩාත් තීව්‍ර කර $F_1$ පරම්පරාව සඳහා ලබා ගැනීමේ හැකියාව ඇත. මේ මගින් ඉතා ඉහළ අස්වනු ලබාදීමේ හැකියාව, පළිබෝධ සඳහා ප්‍රතිරෝධීතාව හා ඒකාකාරී බව (uniformity) වැනි හිතකර ලක්‍ෂණ මෙම $F_1$ දෙමුහුම් වල අඩංගු කරගත හැකි වේ.

කෙසේ නමුත් $F_1$ දෙමුහුම් ප්‍රභේද වගා කිරීමෙන් හට ගන්නා ගෙඩි හෝ කරල් වලින් ස්වයං බීජ නිෂ්පාදනය නිර්දේශ නොකරන අතර නැවත වගා කිරීම සඳහා දෙමුහුම් ක්‍රියාවලිය තුළින් බීජ නිපදවා ගැනීම හෝ එවැනි බීජ මිලදී ගැනීම අවශ්‍ය වේ. එයට හේතුව දෙමුහුම් කිරීමේදී ලැබෙන හිතකර ලක්‍ෂණ ඊලඟ පරම්පරාවේදී වියුක්ත වීම සිදුවිය හැකි බැවින් එම පරම්පරාවේදී $F_1$ දෙමුහුම් ප්‍රභේදයේ ලක්‍ෂණ පෙන්නුම් නොකිරීමට ඉඩ ඇති බැවිනි. දෙමුහුම් බීජවල දක්නට ලැබෙන අවාසිය නම් බීජ නිෂ්පාදන වියදම අධික වීම නිසා අලෙවි මිල ද සාපේක්‍ෂව ඉහළ යාම වැළැක්විය නොහැකි වීමය.



දෙමුහුන් බීජ වී නිෂ්පාදන ක්‍ෂේත්‍රය - ගිරාඳුරුකෝට්ටේ

## නව නිර්දේශිත වී ප්‍රභේද

### 1. ප්‍රභේදය - Bg 407 H

මෙය බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් නිපදවන ලද ඉහළ අස්වනු විභවයක් සහිත **ශ්‍රී ලංකාවේ ප්‍රථම දෙමුහුම් වී ප්‍රභේදයයි.** මාස 4 වයස් කාණ්ඩයට අයත් වන අතර පරිනත වීම සඳහා දින 102 - 119 ගත වේ. සුදු සහලින් යුතු වේ. මෙම ප්‍රභේදය BgHR 6 නමින් ක්‍ෂේත්‍ර පරීක්‍ෂණ සඳහා යොදා ගැනුනි.

මහවැලි සී කලාපයේ හා අම්පාර දිස්ත්‍රික්කයේ පවත්වන ලද විශාල පරිමාණ ගොවි ක්‍ෂේත්‍ර අත්හදා බැලීම් වලදී හෙක්ටයාරයට ටොන් 6.2 - 10 දක්වා අස්වනු ලබාදුනි. මෙම ප්‍රභේදය ගොක් මැස්සා, දුඹුරු පැළ කීඩෑවා හා කොළ පාළුව සඳහා ප්‍රතිරෝධී වන අතර බැක්ටීරියා කොළ අංගමාරය සඳහා මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධී වේ.

ඒකීය ක්‍ෂේත්‍ර ඵලයකින් ලබාගත හැකි ධාන්‍ය අස්වැන්න වැඩි කිරීමේ විභවය දෙමුහුම් ප්‍රභේද සතුව පවතී. දෙමුහුම් බීජ නිෂ්පාදනය සඳහා වැඩි වියදමක් දැරීමට සිදුවන හෙයින් බීජ මිල ද ඉහළ මට්ටමක පවතී. මේ නිසා උසස් අස්වැන්නක් ලබාගන්නා අතරම, වී නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා බීජ අවශ්‍යතාවය අඩු කිරීමට යොදගත හැකි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම පිළිබඳව පර්යේෂණ රාශියක් බතලගොඩ වී පර්යේෂණ ආයතනය හා ගොවි ක්‍ෂේත්‍ර තුළ සිදුකරන ලද අතර එහි ප්‍රතිඵල පහත සඳහන් වේ.

#### තවාන් බීජ අවශ්‍යතාවය

Bg 407 H ප්‍රභේදය සඳහා මඩ තවාන් යොදන්නේ නම් වර්ග මීටරයට ග්‍රෑම් 20 ක් වන සේ යෙදීම වඩා සුදුසු බව සොයා ගන්නා ලදී. අඩු බීජ ඝනත්වය තුළින් තවානේදීම රිකිලි දැමීම වැඩි කරවයි. රිකිලි සහිත එක් පැළයක් බැගින් හා රිකිලි නොදැමූ

පැළ සිටුවීම හා සංසන්දනය කරන ලද අතර රිකිලි දැමූ පැළ සිටුවීමෙන් බීජ අවශ්‍යතාව විශාල ලෙස අවම කර ගත හැකි බව තහවුරු වී ඇත.

### පැළ ඝනත්වය

එක් ස්ථානයක පැළ 1-2 ක් තිබීම ඉහළ අස්වනු සඳහා ප්‍රමාණවත් වේ.

### පැළ සිටුවීමේ පරතරය

දෙමුහුම් වී ප්‍රභේද සඳහා වැඩි පරතරයක් භාවිතා කළ හැකි බව පෙනුණි. එහෙත් ප්‍රායෝගික ගැටළු හා අනෙකුත් සාධක (උදා: වල් පැළෑටි තරගය) අනුව සලකා බලා සෙ.මී. 15 × 20 හා සෙ.මී. 20 × 20 යන පරතරයන් වඩාත් සුදුසු බව තීරණය කර ඇත.

### භෝග පිහිටුවීමේ ක්‍රමය

අතින් පැළ සිටුවීමේ ක්‍රමයට විකල්ප ක්‍රමයක් ලෙස බීජ පැළ විසිරුම් ක්‍රමය (Parachute method) භාවිතා කළ හැකි අතර මේ මඟින් පැළ සිටුවීම සඳහා වැය වන කම්කරු ශ්‍රමය 50% කින් අඩු කළ හැකිය.

### පොහොර

දෙමුහුම් වී ප්‍රභේද සඳහා විශේෂිත පොහොර නිර්දේශයන් නොමැත. අක්කරයට බුසල් 160 ට වඩා වැඩි අස්වනු ලබා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත පොහොර ප්‍රමාණයන් යෙදීම ප්‍රමාණවත් වේ.

මෙම ප්‍රභේදය වාරි ජලය සම්පාදනය යටතේ වී වගාව සඳහා වැඩි විභවයක් සහිත ප්‍රදේශවල වගා කිරීම සඳහා නිර්දේශ කර ඇත. මෙහි බීජ නිෂ්පාදන වැඩ පිළිවෙල බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ ගිරාඳුරුකෝට්ටේ පර්යේෂණ මධ්‍යස්ථානයේ හෙක්ටයාර 5ක ක්‍ෂේත්‍රයක පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත.

*ප්‍රභේද සංවර්ධනය: එස්.ඩබ්. අබේසේකර (පර්.නි.)*
*එස්. කිරිවත්තුඩුව (පර්. නි.)*

## 2. ප්‍රභේදය - Bg 250

සුදු පැහැති සහල් සහිත දින 75-80 කදී පරිනතියට පත්වන කෙටිකාලීන වී ප්‍රභේදයකි. විභව අස්වැන්න හෙක්ටයාරට ටොන් 3.5 කි. පහතරට ප්‍රදේශයේ වර්ෂා පෝෂිත තත්ව යටතේ වගාකරන ජලය හිඟ හෝ ගංවතුර තත්වයනට භාජනය වන කුඹුරු සඳහා මෙම ප්‍රභේදය නිර්දේශ කර ඇත. ජලය වැඩි තත්ව යටතේ මේරීමට ගතවන කාලය දිර්ඝ වන අතර අස්වැන්නද වැඩිවේ.

*ප්‍රභේද සංවර්ධනය : ආචාර්ය එස්. ද ඉසෙඩ් අබේසිරිවර්ධන (අධ්‍යක්‍ෂ, වී පර්.)*
*ජී.ඒ. ජිනදස (පර්. නි.)*

## 3. ප්‍රභේදය - Bg 406

මෙය මාස 04 වයස් කාණ්ඩයට අයත් රතු සහල් ප්‍රභේදයකි. දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී වන අතර, කොළ පාළු රෝගයට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. අස්වනු විභවය හෙක්. ටොන් 4.5 - 5.5 ක් වේ. දැනට මෙම ප්‍රභේදය සඳහා උතුරු නැගෙනහිර කලාපවල ගොවීන්ගෙන් ඉහල ඉල්ලුමක් ලැබී තිබේ. ක්‍ෂේත්‍ර අත්හද බැලීම සඳහා මෙම ප්‍රභේදය Bg 500 යන නමින් භාවිතා කර ඇත.

*ප්‍රභේද සංවර්ධනය: සී.ඒ. සන්දනායක (පර්. නි.)*
*එල්.සී. සිල්වා (පර්. නි.)*

## 4. ප්‍රභේදය - Bg 454

මෙය මාස 4 - 4 1/2 වයස් කාණ්ඩයට අයත් නුමුහුම් වී ප්‍රභේදයකි. ඉහළ ගුණාත්මයකින් යුතු සුදු පැහැති සහලින් යුතු වේ. මෙම ප්‍රභේදය ගොක් මැස්සාට ප්‍රතිරෝධී වන අතර දුඹුරු පැළ කීඩැවා, කොළ පාළුව සහ බැක්ටීරියා කොළ අංගමාරයට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. විශාල පරිමානයේ ප්‍රභේද අත්හද බැලීමේ පර්යේෂණ වලදී ලබාදුන් අස්වැන්න යල සහ මහ කන්න සඳහා පිළිවෙලින් හෙක්. ටොන් 5.42, 6.63 ක් විය. මෙම ප්‍රභේදය ජල සම්පාදනය යටතේ වී වගාව සඳහා ඉහළ විභවයක් සහිත ප්‍රදේශ සඳහා නිර්දේශ කර ඇත. මෙය බීජී 379-2 වෙනුවට ආදේශ කළහැකි ප්‍රභේදයකි.

*ප්‍රභේද සංවර්ධනය : එස්.ඩබ්. අබේසේකර (පර්.නි.)*
*එල්.එස්. සිල්වා (පර්. නි.)*

## 5. ප්‍රභේදය - At 307

ඇද වැටීමට ඔරොත්තු දෙන, ඉහළ අස්වනු ලබාදෙන මාස 3 වයස් කාණ්ඩයට අයත් ප්‍රභේදයකි. කොළ පාළුවට ප්‍රතිරෝධී වන අතර බැක්ටීරියා කොළ අංගමාරය, දුඹුරු පැළ කීඩෑ හානිය, ගොක් මැස්සා සඳහා ප්‍රතිරෝධී/මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ.

විවිධ පාරිසරික තත්ව වලට ඔරෝත්තු දීම සැලකූ කළ බීජී 300 ප්‍රභේදයට වඩා වැඩි හැකියාවක් ඇත. තවද ධාන්‍ය අස්වැන්න හා ගුණාත්මය ද බීජී 300 ට වඩා ඉහල බැවින් මෙය එම ප්‍රභේදය ක්‍රමයෙන් විස්ථාපනය කිරීම සඳහා යෝග්‍ය ප්‍රභේදයක් ලෙස හැඳින්විය හැක. ක්‍ෂේත්‍ර අත්හද බැලීම සඳහා මෙම ප්‍රභේදය At 581 යන නමින් භාවිතා කර ඇත.

*ප්‍රභේද සංවර්ධනය : බී.ඩී. පතිනායක (පර්.නි.)*

# එළවළු ප්‍රභේද

### දඹල

## 6. ප්‍රභේදය - ක්‍රිෂ්ණා

ශ්‍රී ලාංකීය ගෙවතු වගාවන් වලදී ඉතා ජනප්‍රිය භෝග ප්‍රභේදයකි. දැනට SLS 44, UPS 12, SLS 40 යන ප්‍රභේද සමඟ දේශිය ප්‍රභේද රාශියක් ගොවීන් විසින් වගා කරනු ලබයි. SLS 44 ප්‍රභේදය කොළ පැහැති ප්‍රභේදයක් වන අතර එය 1997 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබේ. දැනට ක්‍ෂේත්‍රයේ පවතින අනෙකුත් ප්‍රභේදවල කරල්වල ප්‍රමාණය, ගුණාත්මය හා අස්වැන්න විවිධ බැවින් මෙම ලක්‍ෂණ වැඩිදියුණු කිරීම සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස HORDI - purple ලෙස වරණය කරන ලද ප්‍රභේදය **"ක්‍රිෂ්ණා"** නමින් නිර්දේශ කරන ලදී.

ක්‍රිෂ්ණා ප්‍රභේදය ප්‍රභා අවධි අසංවේදී වන අතර යල හා මහ කන්න දෙකේදීම වගා කළ හැකි වේ. සිටුවීමේ සිට පළමු මල් පිපීම දක්වා දින 50 - 55 ක් ගත වේ. දම්පාට කරල් සහිත වන අතර ආර්ථික කාලය දින 125 කි. විභව අස්වැන්න හෙක්.

ටොන් 25 ක් වේ.

*ප්‍රභේද සංවර්ධනය : ආර්. රාධක්‍රිෂ්ණා මහතා (පර්. නි.)*

## දෙමුහුම් F1 බටු ප්‍රභේද

### 7. ප්‍රභේදය - අමන්ඩා (EGH - 314)
### 8. ප්‍රභේදය - අන්ජලී (EGH - 184)

දැනට ක්ෂෙත්‍රයේ වගා කරන නිර්දේශිත බටු ප්‍රභේද 03 කි. මේවා වසර ගණනාවකට ප්‍රථම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිදහස් කරන ලද ප්‍රභේදයන් වේ. කාලයත් සමඟ මෙම ප්‍රභේදවල ගුණාත්මය හා රෝග පළිබෝධ වලට ඔරොත්තු දීමේ හැකියාව ක්‍රමයෙන් අඩු වී ඇත. එමෙන්ම ආනයනය කරන ලද විදේශීය



අමන්ද (EGH - 314)



අන්ජලි (EGH - 184)

දෙමුහුම් ප්‍රභේද බැක්ටීරියා හිටු මැරීම වැනි රෝග තත්ව වලට අධික ලෙස පාත්‍ර වන අතර දේශීය පාරිභෝගිකයින් ගෙඩි වල ගුණාත්මයට එතරම් ප්‍රියතාවයක් නොදක්වයි.

මෙම ගැටළු මඟ හරවා ගැනීම සඳහා දෙමුහුම් $F_1$ ප්‍රභේද 02 ක් දිවයින පුරා වගා කිරීම සඳහා හඳුන්වා දී ඇත. මෙම ප්‍රභේද දෙක බැක්ටීරියා හිටුමැරීමට ප්‍රතිරෝධී/මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. මෙම වර්ග වගා කිරීමට ගොවීන් විසින් වැඩි කැමැත්තක් පෙන්වා ඇති අතර පාරිභෝගික රුචිකත්වය ඉහළ වේ. දේශීය වර්ග වල අස්වනු වන හෙක්. ටොන් 20-30 හා සසඳන විට නව ප්‍රභේද වල අස්වනු විභවය ටොන් 40-50 ක් පමණ වේ. වර්ග දෙකෙහිම කරල් දම් පැහැ වන අතර EGH 184 වල දම් පැහැය තරමක් වැඩිය.

මෙහි බීජ නිෂ්පාදන වැඩ පිළිවෙල කුණ්ඩසාලේ බීජ නිෂ්පාදන ගොවිපලෙහි සිදු කරන අතර EGH 314 බීජ කිලෝ ග්‍රෑම් 3.5 ක් සහ EGH 184 බීජ කිලෝ ග්‍රෑම් 1.5 ක් දැනට නිෂ්පාදනය කර අලෙවියට ලබාදී ඇත.

*ප්‍රභේද සංවර්ධනය : ආචාර්ය එච්. පොන්සේකා (පර්.නි.)*

## පඳුරු බෝංචි

### 9. ප්‍රභේදය - සන්ජය

මෙම ප්‍රභේදයේ පත්‍ර, මල් හා බීජ වල ලක්ෂණ ට්‍රොප්ක්‍රොප් ප්‍රභේදයෙන් වෙනස් වේ. දින 30 - 35 කදී පුෂ්ප පිපීම ආරම්භ වන අතර ආර්ථික කාලය දින 65 කි. ප්‍රභේද අත්හද බැලීම් පර්යේෂණ වලදී කන්නය හා වගා ප්‍රදේශය අනුව අස්වැන්න හෙක්. ටො. 7.6 - 18.0 දක්වා ලබා දී ඇත. පාමුල කුණුවීම සඳහා ඔරොත්තු දේ. මාංශලමය දිගු කරල් සහිත වේ. ක්ෂේත්‍ර අත්හද බැලීමේ පර්යේෂණ වලදී ප්‍රමෙල් (premel) යන නම භාවිතා කර ඇත.



සංජය

*ප්‍රභේද සංවර්ධනය : ආචාර්ය එච්.එම්. ආරියරත්න (පර්.නි)*

## තක්කාලි

### 10. ප්‍රභේදය - ලංකා සවර් (ගොරකා තක්කාලි)



ලංකා සවර් - ගොරකා තක්කාලි

ශ්‍රී ලාංකිකයන් බොහෝ විට තක්කාලි භාවිතා කරනුයේ ව්‍යාංජන පිළියෙල කිරීමේදී හෝ එවැනි ආකාර ආහාර පිළියෙල කිරීමේදී ආහාරයට ඇඹුල් රසය එක්කර ගැනීම සඳහාය. මේ නිසා බොහෝ දෙනා ඇඹුල් රසය වැඩි තක්කාලි ප්‍රිය කරයි. නිර්දේශ කරන ලද මෙම ගොරකා තක්කාලි ප්‍රභේදය දේශීය ජාන සම්පත් වලින් තෝරා ගන්නා ලද වරණයකි. ගෙඩි වල වර්ණය තැඹිලිමය රතු වන අතර, ගොරකා ගෙඩි වල හැඩය ගනී. මල් හට ගැනීම සඳහා

දින 48 ක් පමණ ගතවේ. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 122 කි. විභව අස්වැන්න හෙක්. ටොන් 29.5 කි (යල කන්නයේ ගන්නොරුවේදී). මෙය බැක්ටීරියා හිටු මැරීමේ රෝගයට ප්‍රතිරෝධී වේ. ආර්ථික කාලය දින 115-120 ක් පමණ වේ.

*ප්‍රභේද සංවර්ධනය : එන්. පරරාජසිංහම් මිය (පර්.නි)*
*රංජනී පීරිස් මිය (පර්.නි)*

### 11. ප්‍රභේදය - මහේෂා



මහේෂා (HFI)

මෙය ඉහල අස්වනු විභවයක් සහිත, බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී, හොඳ ගුණාත්මයේ ගෙඩි සහිත **දෙමුහුම් FI ප්‍රභේදයකි.** ගන්නෝරුව පර්යේෂණ මධ්‍යස්ථානයේ පැවැත්වූ ක්ෂේත්‍ර පර්යේෂණ වලදී යල කන්නයේදී හෙක්ටයාරයකට ටොන් 58 ක් හා මහ කන්නයේදී හෙක්ටයාරයකට ටොන් 56 ක් ලබාදුනි. ඉදුණු ගෙඩි රතු පැහැවන අතර, ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 125 ක් පමණ වේ.

මෙය F1 දෙමුහුම් ප්‍රභේදයක් නිසා ස්වයං බීජ නිෂ්පාදනය නිර්දේශ නොකරන අතර, නැවත වගා කිරීමට FI දෙමුහුම් බීජ ලබාගත යුතුවේ. ක්ෂේත්‍ර අත්හද බැලීමේ කටයුතුවලදී HF1 යන නම භාවිතා කර ඇත.

*ප්‍රභේද සංවර්ධනය: රංජනී පීරිස් මිය (පර්යේෂණ නිලධාරිණී)*

## මඤ්ඤොක්කා

### 12. ප්‍රභේදය - සුරනිමල (BW1)

මෙය කළුතර දිස්ත්‍රික්කයෙන් ස්වාභාවිකව වර්ණය වූ ප්‍රභේදයකි. රිදිමය අළු පැහැති කඳ අග්‍රස්ථයේදී බෙදීම සිදුවේ. ලපටි පත්‍ර රතු දුඹුරු වන අතර, කොළ පැහැති මේරු පත්‍ර තද රෝස - රතු නටුවකින් යුතුවේ. දුඹුරු පිටපොත්තකින් හා සුදු පැහැති මාංශලයකින් යුතු දිගු අල වලින් සමන්විතය. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 35 -50 කි. හයිඩ්‍රජන් සයිනයිඩ් (HCN) ප්‍රමාණය ppm 38.34 කි.

### 13. ප්‍රභේදය - ස්වර්ණා (BW 2)

රිදිමය අළු පැහැති කඳ අග්‍රස්ථයේදී අතු බෙදීම සිදු නොවේ. ළපටි පත්‍ර රතුමය දුඹුරු පැහැ වන අතර, කොළ පැහැ මේරු පත්‍රවල නටුව තද රතු පැහැයෙන් යුතු වේ. මධ්‍යම ප්‍රමාණ අලවල පිටත පොත්ත දුඹුරු පැහැ වේ. මදය කහ පැහැතිය. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 35 -40 කි. හයිඩ්‍රජන් සයනයිඩ් ප්‍රමාණය ppm 20-52කි.

### 14. ප්‍රභේදය - ශානි (BW 14)

මෙය කොළඹ දිස්ත්‍රික්කයේ වගාවන්ගෙන් වරණය කර ගන්නා ලද්දකි. කඳ තද දුඹුරු පැහැ වන අතර, කල්ගතවූ පසු අතු බෙදීම පෙන්නුම් කරයි. පත්‍ර හා නටු කොළ පැහැති වේ. විශාල අල වල පිට පොත්ත දුඹුරු පාට වන අතර, මාංශලය සුදු පැහැ වේ. අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 35 - 40 කි. හයිඩ්‍රජන් සයිනයිඩ් ප්‍රමාණය ppm 43 කි.

*ප්‍රභේද සංවර්ධනය : එස්.එන්. හරිස්චන්ද්‍ර (පර්.නි)*
*ආචාර්ය ජේ.බී.ඩී.එස්. කහඳවල (පර්.නි.)*
*කේ.කේ.එන්.ඩී. සිල්වා (පර්. සහකාර)*
*සී.ඩී. වික්‍රමසිංහ (පර්.සහකාර)*

## බතල

### 15. ප්‍රභේදය - ධවල




මෙය දේශීය සහ විදේශීය ජාන දර්ශ එකතුවකින් ලබා ගන්නා ලද ප්‍රභේදයකි. මාතෘ දෙමාපියන් ලෙස රණබිම ප්‍රභේදය හැඳින්විය හැක. අල වල පොත්ත සුදු පැහැවන අතර, මාංශලය ලා කහ පැහැ වේ. විභව අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 24 කි. ප්‍රභේද අත්හදා බැලීමේ දී HORDI C - 15 යන නම භාවිතා කර ඇත.

### 16. ප්‍රභේදය - අමා




SAPPRAD ව්‍යාපෘතිය යටතේ ගෙන්වන ලද ස්වපරාගනය වූ බතල බීජ (ග්‍රෑම් 1000) මගින් වරණය කරන ලද්දකි. අලවල පොත්ත රෝස පැහැවන අතර, මාංශලය තැඹිලි පැහැ වේ. කෑගල්ල, මහනුවර හා මාතලේ ප්‍රදේශ වල වගාකර ලබා ගත් විභව අස්වැන්න හෙක්ටයාරයකට ටොන් 26.9 කි. ප්‍රභේද අත්හදා බැලීමේ දී HORDI P2 - 20 යන නම භාවිතා කර ඇත.

*ප්‍රභේද සංවර්ධනය: ඒ. ප්‍රේමතිලක මිය (පර්. නි.)*

## කොස්

### 17. ප්‍රභේදය - හිරෝසා

මෙම ප්‍රභේදය විශාල ගෙඩි (10-15 කි.ග්‍රෑ) වලින් සමන්විත වන අතර, අවු: 13 ක් වයසැති ශාකයක් වසරකට ගෙඩි 25-30 ක් ලබාදුනි. ගෙඩි මේරීම සඳහා දින 120-135 ක් ගතවේ. පළමු වරට මල් හට ගැනීම සඳහා අවු: 4 ක් පමණ ගතවේ. ඝනකම සහිත (0.6 සෙ.මී) හැපෙන සුළු, පැණි රසයෙන් යුතු,



හිරෝසා කොස්



ආකර්ශණීය කහමය තැඹිලි වර්ණ මදුළු සහිත වරකා ආකාර ප්‍රභේදයකි. බික්ස් අගය 22 ක් පමණ වේ. ආහාරයට ගත හැකි කොටස 50% කි. කොස් ඇටයේ සිවිඩ්ඩ රෝස පැහැ වේ. මෙනිසා මෙම කෙස් ප්‍රභේදය රෝස කොස් ලෙස ව්‍යවහාරය කෙරේ. මදුළු විශාල වන අතර, පළතුරක් මෙන්ම එළවළුවක් (පොළොස්) ලෙස යෝග්‍ය වේ.

### 18. ප්‍රභේදය - මන්ඩූර් (Mandoor)






මන්ඩූර් කොස්

ආකර්ශනීය කොල පැහැයෙන් යුතු පිටපොත්තක් සහිත මෙම ප්‍රභේදය මධ්‍යම ප්‍රමාණ (8-10 කි.ග්‍රෑ) ගෙඩි වලින් යුතු වේ. අවුරුදු 13 ක් වයසැති ගසකින් වසරකට ගෙඩි 25 -30 ක් ලබාදේ. ගෙඩි පරිණත වීමට දින 120-135 ක් ගතවේ. පළමු වරට මල් හටගැනීම සඳහා වසර 4-5 ක් ගතවේ.

පැණි රසින් යුතු, හැපෙන සුළු තද කහ පැහැති මදුළු සහිත වරකා ආකාර ප්‍රභේදයකි. බික්ස් අගය 22 ක් පමණ වේ. ඉදෙන විට මදුළු තුළ පැළවූ බීජ දක්නට නොලැබේ. ආහාරයට ගත හැකි කොටස 50% කි. මදුළු විශාල වන අතර, පළතුරක් ලෙස මෙන්ම එළවළුවක් (පොළොස්) ලෙසද සුදුසු වේ.

*ප්‍රභේද සංවර්ධනය: අයි. මැදගොඩ මිය (පර්.නි.)*

## කෙසෙල්

### 19. ප්‍රභේදය - අග්‍රා




කෙසෙල් ප්‍රභේද අතුරින් වඩා වැඩි ඉල්ලුමක් හා මිලක් කෝලිකුට්ටු වලට හිමිවේ. මෙහි වගා දර්ශ රාශියක් දිවයින පුරා වගා වෙන නමුත් බොහෝ වගා දර්ශ වල ගෙඩිවල තද ගතියෙන් යුතු කොටස් අඩංගු වන බැවින් ගුණාත්මය දුර්වල වේ. මේ නිසා දිවයිනේ වගා වෙන කෝලිකුට්ටු දර්ශ අතුරින් තෝරාගත් ඉහළ ගුණාත්මයෙන් යුතු වගා දර්ශයක් අග්‍රා නමින් වගා කිරීම සඳහා නිර්දේශ කර ඇත. මෙහි ගෙඩිවල තද කොටස් නොමැති අතර, ඉහළ ගුණාත්මයෙන් යුතු ගෙඩි සහිත වේ. මව් ශාකයෙන් හටගන්නා කැනක සාමාන්‍ය බර කි.ග්‍රෑ. 20.4 ක් පමණ වේ.

*ප්‍රභේද සංවර්ධනය : අචාර්ය සුජාතා වීරසිංහ (පර්.නි.)*

## ගොරකා

### 20. ප්‍රභේදය - වීරපාන

මෙම ප්‍රභේදය ගෙවතු වගාව සඳහා නිර්දේශ කර ඇත. මෙය පඳුරු ආකාර, ද්වි ලිංගික මල් සහිත, කෙටි කලකින් ඵල දරන ප්‍රභේදයකි. මේ නිසා මෙය අලංකාර ශාකයක් ලෙස මෙන්ම ගෙවතු බෝගයක් ලෙසද වඩාත් සුදුසු වේ. ගෙඩියක බර ග්‍රෑම් 83-226 ක් අතර වේ. ගසකින් වියළි ගොරකා කැබලි 500-750 ක් පමණ ලබාදේ. පළමුවරට අස්වනු හට ගැනීම සඳහා වසර 3 ක් පමණ ගතවන අතර, ගෙඩි පරිනතවීම සඳහා දින 100-120 ක් ගතවේ. මල් හා ගෙඩි හටගන්නා කාලය පිළිවෙලින් පෙබරවාරි - මාර්තු සහ ජුනි - අගෝස්තු වේ.

*ප්‍රභේද සංවර්ධනය : අයි. මැදගොඩ මිය (පර්.නි.)*




ඵල දරන ගොරකා ශාකයක්

**කෘෂි - තාක්ෂණ ....... ලුහුඬින්**

කාලීන තාක්ෂණික තොරතුරු සංක්ෂිප්තව තාක්ෂණවේදීන්, විශේෂයෙන්ම ව්‍යාප්ති නිලධාරීන් වෙත ලබාදීමේ අරමුණ උදෙසා කෘෂි - තාක්ෂණ පත්‍රිකාව ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ. මෙම පත්‍රිකාවේ අඩංගු තොරතුරු බොහොමයක්ම ප්‍රභවය වී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන සහ මධ්‍යස්ථාන වලිනි. තවද, වෙනත් ඕනෑම මූලාශ්‍රයකින් උපුටා ගත හැකිවූද, ක්ෂේත්‍රයේ ප්‍රායෝගිකව යොදාගත හැකිවූද, තොරතුරු වේ නම්, එවැනි දෑ ද කෘෂි - තාක්ෂණ පත්‍රිකාවෙහි අන්තර්ගත වනු ඇත.

*- සංස්කාරක -*

*රචනය හා සංස්කරණය*
**ජයන්තා ඉලන්කෝන්**

වැඩිදුර තොරතුරු සඳහා විමසන්න : අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, තැ.පෙ. 18, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය.

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය මගින් ප්‍රකාශයට පත් කෙරිනි.

**රා.සේ.පි.**

**මුද්‍රිත ද්‍රව්‍යය**
**භාර නොදුනහොත් ආපසු යොමු කරන්න:**

**අධ්‍යක්ෂ,**
**ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය,**
**තැ.පෙ. 18,**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,**
**පේරාදෙණිය.**

මෙම පත්‍රිකාව, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ පරිගණක අංශයේ පිටු සකස් කර ගන්නොරුව කෘෂිකර්ම මුද්‍රණාලයේ දී මුද්‍රණය කරන ලදී.